# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

**සමාජීය විද්‍යා පීඨය**

## භූගෝල විද්‍යාව

**මානුෂ භූගෝල විද්‍යාව - GEOG 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. i. 'අවකාශය' සහ 'ස්ථානය' (Space and Place) යන සංකල්පය මානුෂ භූගෝල විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

    ii. පෘථිවියේ යම් 'අවකාශයක්' 'ස්ථානයක්' බවට පරිවර්තනය කිරීමේ දී මානුෂ භූගෝල විද්‍යාවෙන් ලැබෙන පිටිවහල පෙන්වා දෙන්න. (ලකුණු 10)

02. ''ගෝලීය සංස්කෘතික විවිධත්වය' මානුෂ භූගෝල විද්‍යාව හදාරන විද්‍යාර්ථියකු ලෙස විග්‍රහ කරන්න. (ලකුණු 20)

03. i. ජන සංඛ්‍යාවක ගති ලක්ෂණ (Population Characteristics) හඳුන්වන්න. (ලකුණු 10)

    ii. ජන සංඛ්‍යා සංක්‍රාන්ති ආදර්ශකය (Demographic Transition Model) පැහැදිලි කරන්න. (ලකුණු 10)

04. i. 'භූ දේශපාලනය' (Geopolitics) යනු කුමක්ද? (ලකුණු 05)

    ii. ලෝකයේ දැනට දක්නට ලැබෙන ඕනෑම භූ දේශපාලනික අර්බුද දෙකක් තෝරාගෙන ඒවා උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

05. ලෝකයේ රටවල් අතර සංවර්ධන අසමානතා බිහිවීමට බලපාන ප්‍රධාන සාධක හතරක් (04) විග්‍රහ කරන්න. (ලකුණු 20)

06. ලෝකයේ ස්වභාවික පරිසර පද්ධති විනාශ කිරීමෙන් මතුව තිබෙන ගෝලීය ගැටළුවක් හඳුනාගෙන, එහි අහිතකර බලපෑම් අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් (03) උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 20)

07. ලෝක කෘෂිකර්මාන්තයෙහි දක්නට ලැබෙන නව ප්‍රවණතා හතරක් (04) විමර්ශනය කරන්න. (ලකුණු 20)

08. තිරසාර සංවර්ධන අභිමතාර්ථ ඉටුකරගැනීමේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 20)

*********************************